# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යොන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ඔක්තෝබර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 27.00 යි. තැපැල් ගාස්තුව : රු. 11.25 යි.

# 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 22 වන දින]

එල්. ඩී.–ඕ.43/95.

**ශ්‍රී ලංකාව සහ නිශ්චිත රටවල් විසින් සාපරාධී කාරණාවල දී සහයෝගය ලබා දීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

2. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මේ පනතේ විධිවිධාන, එහි සඳහන් යම් පොදු රාජ්‍ය මණ්ඩලයේ රටක් සම්බන්ධයෙන් අදාළ විය යුතු යයි ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය. පනත අදාළ කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක්ම, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයක හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ බලාත්මක විය යුතු ය.

(3) මේ පනත ආරම්භ වූ දිනට පෙර හෝ ඉන්පසුව ශ්‍රී ලංකාව හා පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් නොවන යම් රටක් අතර, සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව ලබාගැනීම සඳහා ගිවිසුමක් ඇතිකරගනු ලැබූ අවස්ථාවක, ඒ ගිවිසුමේ නියමයන් බලාත්මක කිරීමේ කාර්යය සඳහා පමණක් ඒ ගිවිසුමේ නියමයන් සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් ස්වකීය නියමයේ සඳහන් කිරීමට යෝග්‍ය යයි සලකනු ලබන යම් සීමා කිරීම් හා කොන්දේසිවලට යටත්ව, පොදු රාජ්‍ය මණ්ඩලයේ රටක් නොවන ඒ රට සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු යයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයකින්ම ඒ නියමය කරන ලද්දේ යම් ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් ද ඒ ගිවිසුමේ කොන්දේසි කියවිය යුතු අතර, එය, නියමය ගැසට්

පත්‍රයේ පළ කරනු ලැබූ දින හෝ සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක බලාත්මක විය යුතු ය. තවද, නියමය කරන ලද්දේ යම් ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් ද ඒ ගිවිසුම බලාත්මකව පවත්නා තාක් කල් පමණක් ඒ නියමය බලාත්මක විය යුතු ය.

(5) (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම, පහසුවෙන්ම හැකිතාක් ඉක්මණින් එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව, අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක්, ඒ අනනුමතයේ දින පටන්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ වූ නියමයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ නියමයක් කරන ලද්දා වූ සහ තත් කාලයේ බලපවත්නා සෑම පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය නොවන රටක් මෙහි මින් මතු "නිශ්චිත රටක්" වශයෙන් හඳුන්වනු ලැබේ.

පනතේ අරමුණ.

3. මේ පනතේ අරමුණ වනුයේ පහත සඳහන් කරුණු ද ඇතුළුව, සාපරාධී කාරණාවල දී ශ්‍රී ලංකාව විසින් සහයෝගිතාව දැක්වීම හා ලබාගැනීම පිළිබඳ විධිවිධානය පහසුකරලීම ය:–

(අ) සාක්ෂිකරුවන් හෝ සැකකරුවන් සිටින ස්ථාන සහ ඔවුන් හඳුනාගැනීම ;

(ආ) ලේඛන භාරදීම ;

(ඇ) සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීම ;

(ඈ) සාක්ෂි, ලේඛන හෝ වෙනත් භාණ්ඩ ලබාගැනීම ;

(ඉ) සෝදිසිකිරීම් හා තහනමට ගැනීම සඳහා වූ ඉල්ලීම ක්‍රියාත්මක කිරීම ;

(ඊ) අත්අඩංගුවේ පසුවෙන තැනැත්තකු සාක්ෂිකරුවකු වශයෙන් පෙනී සිටීම සඳහා තාවකාලිකව මාරුකිරීමක් ක්‍රියාත්මක කිරීම ;

(උ) සාක්ෂිකරුවන් පෞද්ගලිකව පෙනී සිටීම සඳහා පහසුකම් සැලසීම ;

(ඌ) ලේඛන හා වෙනත් වාර්තා සැපයීම ;

(එ) යම් සාපරාධී ක්‍රියාවකින් ලත් මුදල් තිබෙන ස්ථාන සොයා ගැනීම ;

(ඒ) දඩ ගෙවීම සඳහා හෝ දේපළ අවුරා තැබීම හෝ රාජසන්තක කිරීම සඳහා වූ නියමයන් බලාත්මක කිරීම.

මධ්‍යම බලධරයා.

4. (මෙහි මින් මතු "මධ්‍යම බලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මේ පනතේ කාර්යය සඳහා මධ්‍යම බලධරයා වන්නේ ය.

නිශ්චිත රටක් විසින් කරනු ලබන ඉල්ලීම.

5. යම් නිශ්චිත රටක නිසි බලධරයා විසින් අපරාධ නඩු අධිකරණයක අධිකරණ බලසීමාවට පත් වන්නා වූ සාපරාධී කාරණයකට අදාළව සහාය ඉල්ලමින්, ඒ රටේ මධ්‍යම බලධරයා වෙත කරන ලද ඉල්ලීමක් –

(අ) ඒ ඉල්ලීම, මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති නිසි ආකෘතියෙහි සාරානුකූලව කරනු ලැබ ඇත්නම් ; සහ

(ආ) මධ්‍යම බලධරයා විසින් ඒ කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි ලේඛන කිසිවක් ඒ ඉල්ලීම සමග එවනු ලැබ ඇත්නම්,

මිස, මධ්‍යම බලධරයා විසින් පිළිගනු නොලැබිය යුතු ය.

සහාය දීම ප්‍රතික්ෂේප කිරීම.

6. (1) මේ පනත යටතේ සහාය ලබාගැනීම සඳහා නිශ්චිත රටක නිසි බලධරයා විසින් කරන ලද ඉල්ලීමක්, මධ්‍යම බලධරයාගේ මතය අනුව,–

(අ) ඉල්ලීමක්, ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් තැනැත්තකුට එරෙහිව නඩු පැවරීමට හෝ දඬුවම් පැමිණ වීමට අදාළව, එය ශ්‍රී ලංකාව තුළ දී සිදු කිරීමෙන් ශ්‍රී ලංකාවේ නීතිය යටතේ වරදක් සංස්ථාපනය වී නොමැත්තේ නම් ;

(ආ) ඉල්ලීම, දේශපාලන ස්වභාවයක වරදක් සම්බන්ධයෙන් තැනැත්තකුට එරෙහිව නඩු පැවරීමට හෝ දඬුවම් පැමිණවීමට අදාළ වේ නම් ;

(ඇ) ඉල්ලීමට, ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් තැනැත්තකුට එරෙහිව නඩු පැවරීමට හෝ දඬුවම් පැමිණවීමට අදාළව, එය ශ්‍රී ලංකාව තුළ දී සිදු කිරීමෙන් ශ්‍රී ලංකාවේ යුද්ධ නීතිය යටතේ පමණක් වරදක් සංස්ථාපනය වී ඇත්තේ නම් ;

(ඈ) ඉල්ලීම වරදක් සම්බන්ධයෙන් නැතහොත් ඒ වරද සංයුක්ත වන ක්‍රියාවෙන්ම හෝ නොකර හැරීමෙන්ම සංයුක්ත වන වෙනත් වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නීතියට අනුකූලව යම් තැනැත්තකු නිදොස් කරනු ලැබ ඇති හෝ වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට එරෙහිව, නඩු පැවරීමට අදාළ වේ නම් ;

(ඉ) ඉල්ලීම ඉටුකරලීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වේ නම් හෝ ජාතික ආරක්ෂාවට, ජාත්‍යන්තර සම්බන්ධතාවලට හෝ රජයේ ප්‍රතිපත්තියට හානිකර වේ නම් ;

(ඊ) ඉල්ලීම ඉටුකරලීමෙන් සැලකිය යුතු හේතූන් මත නඩු පැවරීම හෝ දඬුවම් කිරීම පහසු කෙරේ නම්, නැතහොත්, ඔහුගේ ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මත හෝ උපන් ස්ථානය නිසා හානියක් සිදු වේ නම්,

මුළුමනින්ම හෝ අඩ වශයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, ශ්‍රී ලංකාවේ දී සිදු වූයේ නම් ශ්‍රී ලංකාවේ නීතිය අනුව වරදක් සංයුක්ත නොවිය හැකිව තිබුණු යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, මධ්‍යම බලධරයාගේ මතය අනුව බරපතල ස්වභාවයක වන්නේ නම් හා මේ පනතේ අර්ථානුකූලව සාපරාධී කාරණයක් වන්නේ නම්, ඒ ක්‍රියාවට හෝ නොකර හැරීමට අදාළ වූ ඉල්ලීමක් නිසි බලධරයා විසින් භාර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) යම් වරදක්, ශ්‍රී ලංකාව හා ඉල්ලීම කරනු ලබන නිශ්චිත රට යන රටවල් දෙකම පාර්ශ්වකරුවන් වන ජාත්‍යන්තර සම්මුතියක විෂය පථයට ඇතුළත් වන්නා වූ වරදක් සහ ඒ වරද කිරීමෙහිලා චෝදනා ලැබූ තැනැත්තකු උදර්පණය කිරීමට හෝ ඔහුට විරුද්ධව නඩු පැවරීමට ඊට සම්බන්ධ පාර්ශ්වකරුවන් කෙරෙහි බැඳීමක් ඇති කරන්නා වූ වරදක් වේ නම්, ඒ වරද (1) වන උපවගන්තියේ කාර්ය සඳහා දේශපාලන ස්වභාවයේ වරදක් ලෙස නොසැලකිය යුතු ය.

## II වන කොටස
## තැනැත්තන් සොයාගැනීම හා හඳුනාගැනීම සම්බන්ධයෙන් සහාය දීම

තැනැත්තන් සොයා ගැනීමේ දී හා හඳුනාගැනීමේ දී සහාය දීම.

7. (1) යම් නිශ්චිත රටක අපරාධ නඩු අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළතට වැටෙන යම් සාපරාධී කරුණකට,–

(අ) සම්බන්ධ වී ඇතැයි සැකකරනු ලබන්නා වූ ; හෝ

(ආ) සාක්ෂි දීමට හෝ සහාය දීමට හැකියාවක් ඇත්තා වූ, සහ ශ්‍රී ලංකාවේ සිටී යයි විශ්වාස කරනු ලබන්නා වූ

යම් තැනැත්තකු සොයා ගැනීමට සහාය ලබාගැනීම සඳහා හෝ තැනැත්තාගේ අනන්‍යතාව නොදනිනම්, ඒ තැනැත්තා හඳුනා ගැනීමට හා සොයා ගැනීමට සහාය ලබාගැනීම සඳහා නිශ්චිත රටක නිසි බලධරයාගෙන් මධ්‍යම බලධරයා වෙත ඉල්ලීමක් ලැබුණු අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින්, ඔහුගේ අභිමතය අනුව, ඒ ඉල්ලීම, ආරක්ෂක කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමුකර, නිසි බලධරයාගේ ඉල්ලීමට අනුකූලව කටයුතු කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි පරීක්ෂණ කිසිවක් කළ යුතු යයි ඔහුගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර, ඒ ලේකම්වරයා වෙතින් පරීක්ෂණ පිළිබඳ වාර්තාවක් ලැබීමෙන් පසු, ඒ වාර්තාව, ඉල්ලීම කරනු ලබන නිශ්චිත රටේ නිසි බලධරයා වෙත යැවීමට සැලැස්විය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ අපරාධ නඩු අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළතට වැටෙන යම් සාපරාධී කරුණක් සම්බන්ධයෙන් -

(අ) සම්බන්ධ වී ඇතැයි සැක කරනු ලැබූ ; හෝ

(ආ) සාක්ෂි දීමට හෝ සහාය දීමට හැකියාව ඇත්තා වූ,

යම් තැනැත්තකු නිශ්චිත රටක සිටී යයි විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු ඇති අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින්, ස්වකීය අභිමතය අනුව ඒ තැනැත්තා සොයා ගැනීමට හා ඔහුගේ අනන්‍යතාව තොදනිතම්, ඒ තැනැත්තා හඳුනාගැනීම හා සොයාගැනීම සඳහා ඒ නිශ්චිත රටේ නිසි බලධරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමකින්, ඒ සහාය, අවශ්‍ය වන්නේ කවර කාර්යයක් සඳහා ද ඒ කාර්යය නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා හඳුනාගැනීම හෝ සොයාගැනීම පහසුකරලිය හැකි වෙන යම් තොරතුරක් ද එහි සඳහන් විය යුතු ය.

III වන කොටස
සිතාසි හා වෙනත් ලේඛන භාරදීමට අදාළ සහාය

ශ්‍රී ලංකාවේ දී යම් සිතාසියක් හෝ ලේඛනයක් භාරදීම සඳහා නිශ්චිත රටක් විසින් කරනු ලබන ඉල්ලීම.

8. (1) නිශ්චිත රටක නිසි බලධරයාගෙන්, —

(අ) ඒ රටේ අපරාධ නඩු කටයුතුවල දී විත්තිකරුවකු වශයෙන් පෙනී සිටීම හෝ සාක්ෂිකරුවකු වශයෙන් පැමිණීම සඳහා නියම කෙරෙන සිතාසියක් හෝ වෙනත් අධිකරණ විධානයක් ;

(ආ) ඒ රටේ අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කෙරෙමින් හා ඒ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී දෙන ලද අධිකරණ තීන්දුව සටහන් කෙරෙමින් අධිකරණයක් විසින් නිකුත් කරන ලද ලේඛනයක්,

ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු වෙත භාරදිය යුතු බවට කෙරුණු ඉල්ලීමක් ද සමග මධ්‍යම බලධරයා වෙත ලැබුණු අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින්, ස්වකීය අභිමතය අනුව, ඒ සිතාසිය හෝ ලේඛනය ඒ තැනැත්තා වාසය කරන අධිකරණ බලසීමාව ඇතුළත වූ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත යවනු ලැබිය යුතු ය.

(2) නිසි බලධරයා විසින් මධ්‍යම බලධරයා වෙත කරනු ලබන ස්වකීය ඉල්ලීමෙහි භාරදීමේ ක්‍රමය නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඒ සිතාසිය හෝ ලේඛනය යවන ලද්දේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක මහෙස්ත්‍රාත්වරයකු වෙත ද ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ සිතාසිය

හෝ ලේඛනය භාරදිය යුතු ක්‍රමය ශ්‍රී ලංකාවේ නීතිවලට නොගැලපේ නම් මිස, හැකි සෑම අවස්ථාවක දී ම, ඒ ඉල්ලීමට අනුකූලව භාරදීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය. ඉල්ලීමෙහි සඳහන් භාර දිය යුතු ක්‍රමය ශ්‍රී ලංකාවේ නීතිවලට නොගැලපෙන අවස්ථාවක ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව ඒ සිතාසිය හෝ ලේඛනය භාරදීමට මහෙස්ත්‍රාත්වරයා විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) ඉල්ලීම අදාළ වන තැනැත්තා වෙත ඒ සිතාසිය හෝ ලේඛනය භාරදෙනු ලැබූ අවස්ථාවක, එය භාර දෙන ලද්දේ කෙදිනක ද කෙසේ ද යන බව දැක්වෙන සහතිකයක් මහෙස්ත්‍රාත්වරයා විසින් මධ්‍යම බලධරයා වෙත යැවිය යුතු අතර, එය භාර දෙන ලද්දේ යම් තැනැත්තකු වෙත ද එය ලැබුණු බවට ඒ තැනැත්තා විසින් අත්සන් කරන ලද ලියවිල්ලක් ඇතොත් එය ද ඊට ඇමිණිය යුතු ය.

(4) ඒ සිතාසිය හෝ ලේඛනය, ඉල්ලීම අදාළ වන තැනැත්තා වෙත යථාපරිදි භාර දිය නොහැකි නම්, ඒ සිතාසිය හෝ ලේඛනය (1) වන උපවගන්තිය යටතේ යවන ලද්දේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ද ඒ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් (5) වන උපවගන්තියට යටත්ව, ඒ තැනැත්තා සිටින තැන් පිළිබඳව අධිකරණය සතු තොරතුරු කිසිවක් සැපයෙන ප්‍රකාශයක් සමග ඒ සිතාසිය හෝ ලේඛනය මධ්‍යම බලධරයා වෙත ආපසු යවනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ වාසය නොකරන බවට තමා සෑහීමට පත්වන්නේ නම් මිස, මධ්‍යම බලධරයා විසින් ඒ සිතාසිය හෝ ලේඛනය පිළිබඳව (1) වන උපවගන්තිය යටතේ කටයුතු කරනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ වාසය නොකරන බවට මධ්‍යම බලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඉල්ලීම කරනු ලබන නිශ්චිත රටේ නිසි බලධරයා වෙත, ඔහු විසින් ඒ සිතාසිය හෝ ලේඛනය ආපසු යවනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ සිතාසිය හෝ ලේඛනය යවන ලද්දේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක මහෙස්ත්‍රාත්වරයකු වෙත ද ඒ මහෙස්ත්‍රාත්වරයා, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ වෙනත් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත වාසය

කරන බවට සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් ඒ සිතාසිය හෝ ලේඛනය ඒ වෙනත් අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා වෙත යවා, තමා එසේ කළ බව මධ්‍යම බලධරයා වෙත දැනුම් දිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ සිතාසිය හෝ ලේඛනය යවන ලද්දේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක මහෙස්ත්‍රාත්වරයකු වෙත ද ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්, එය (1) වන උපවගන්තිය යටතේ ඒ අධිකරණය වෙත යැවූ ලෙස සලකා කටයුතු කර ගෙන යා යුතු ය. මහෙස්ත්‍රාත්වරයා විසින්, ඉල්ලීම අදාළ වන තැනැත්තා වෙත එය භාරදීමෙන් පසුව, එය භාර දෙන ලද්දේ කෙදිනකද, කෙසේද යන බව දැක්වෙන සහතිකයක් මධ්‍යම බලධරයා වෙත යැවිය යුතු අතර, එය භාර දෙන ලද්දේ යම් තැනැත්තකු වෙත ද, එය ලැබුණු බවට ඒ තැනැත්තා විසින් අත්සන් කරන ලද ලියවිල්ලක් ඇතොත්, එය ද ඊට ඇමිණිය යුතු ය.

(7) මධ්‍යම බලධරයා විසින් (3) වන උපවගන්තිය හෝ (6) වන උපවගන්තිය යටතේ සහතිකයක් ලැබුණු විට, එම සහතිකය, ඉල්ලීම කරනු ලබන නිශ්චිත රටේ නිසි බලධරයා වෙත යවනු ලැබිය යුතු ය.

(8) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් එවැනි යම් සිතාසියක් යම් තැනැත්තකු වෙත භාර දීමෙන්, ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ඊට අනුකූලව කටයුතු කිරීම සඳහා වූ යම් බැඳීමක් නොපැනවිය යුතු ය.

නිශ්චිත රටක දී භාරදීම සඳහා මධ්‍යම බලධරයා විසින් කරනු ලබන ඉල්ලීම.

**9.** (1) ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් නිකුත් කරන ලද්දා වූ හෝ කරන ලද්දා වූ, —

(අ) වරදකට චෝදනා ලැබූ තැනැත්තකු ශ්‍රී ලංකාවේ අධිකරණයක් ඉදිරියේ පෙනී සිටිය යුතු බවට නියම කෙරෙමින් වූ සිතාසියක් ; සහ

(ආ) අපරාධ නඩු කටයුතුවල දී සාක්ෂි දීමේ කාර්යය සඳහා, තැනැත්තකු ශ්‍රී ලංකාවේ අධිකරණයක් ඉදිරියට පැමිණිය යුතු බවට නියම කෙරෙමින් වූ සිතාසියක් හෝ ආඥාවක්,

පිළිබඳ අවස්ථාවක දී, නිශ්චිත රටේ ඒ තැනැත්තා වෙත ඒ සිතාසිය හෝ ආඥාව භාරදෙන ලෙස ඒ තැනැත්තා වාසය කරන නිශ්චිත රටේ නිසි බලධරයාගෙන් මධ්‍යම බලධරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර, ඒ සිතාසිය හෝ ආඥාව භාරදීමේ ක්‍රමය ඒ ඉල්ලීමෙහි සඳහන් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන ලද්දේ නිශ්චිත රටක යම් නිසි බලධරයකු වෙත ද ඒ නිසි බලධරයා විසින්, ඒ ඉල්ලීම අදාළ වන සිතාසිය හෝ ආඥාව නිශ්චිත රටේ වාසය කරන තැනැත්තකු වෙත භාර දෙන ලද බව මධ්‍යම බලධරයා වෙත දන්වනු ලැබ ඇත්තා වූ සහ ඒ භාරදීම යථා පරිදි සැබෑ බවට සහතික කරන ලද වාර්තාවක් යවනු ලැබ ඇති අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින්, ඒ සිතාසිය නිකුත් කළ හෝ ආඥාව කළ අධිකරණය වෙත ඒ වාර්තාව යැවීමට කටයුතු සැලැස්විය යුතු අතර, ඒ වාර්තාව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය. තවද, එහි සඳහන් ප්‍රකාශ, පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, නිවැරදි යයි සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## සාක්ෂි ගැනීම හා ලේඛන හෝ වෙනත් භාණ්ඩ ඉදිරිපත් කිරීමට අදාළ සහාය

10. (1) නිශ්චිත රටක නිසි බලධරයා විසින්, නිශ්චිත රටේ සාපරාධී කාරණාවකට අදාළව, නඩු කටයුත්තක කාර්යය සඳහා– ශ්‍රී ලංකාවේ දී සාක්ෂි ගැනීම හා ලේඛන ආදිය ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත රටක් විසින් කරනු ලබන ඉල්ලීම.

(අ) ශ්‍රී ලංකාව තුළ දී සාක්ෂි ගැනීමට ; හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ දී ලේඛන හෝ වෙනත් භාණ්ඩ ඉදිරිපත් කිරීමට,

මධ්‍යම බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින්, ස්වකීය අභිමතය පරිදි, ඒ සාක්ෂි ගැනීම සඳහා හෝ ඒ ලේඛන හෝ භාණ්ඩ භාර ගැනීම සඳහා අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් කරන ලද සාමාන්‍ය හෝ විශේෂ ආඥාවක් මගින් බලය ලැබ, ඒ ඉල්ලීම මහෙස්ත්‍රාත්වරයකු වෙත යොමු කළ යුතු අතර, ඒ සාක්ෂි, ලේඛන හෝ භාණ්ඩ ඒ මහෙස්ත්‍රාත්වරයාගෙන් ලැබුණු විට, ඒවා නිශ්චිත රටේ නිසි බලධරයා වෙත යවනු ලැබිය යුතු ය.

(2) නිශ්චිත රටක නිසි බලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක ම, නඩුවේ අවස්ථාගත කරුණු මගින් අවකාශ ලැබෙනතාක් දුරට–

(අ) පරීක්ෂා කරනු ලැබිය යුතු සාක්ෂිකරුවන්ගේ නම් සහ ලිපිනයන් හෝ නිල පදවි නාම ;

(ආ) සාක්ෂිකරුවන්ගෙන් ඇසිය යුතු ප්‍රශ්න හෝ ඔවුන් පරීක්ෂණයට ලක්කරනු ලැබිය යුතු විෂය කරුණු ;

(ඇ) සාක්ෂිකරුවන් පරීක්ෂණයට ලක් කළ යුත්තේ වාචිකව ද ලිඛිතව ද යන බව ;

(ඈ) ඉල්ලීමට අදාළ යයි පෙනී යන වරප්‍රසාද හෝ සාක්ෂි දීමෙන් නිදහස් කිරීම් පිළිබඳව, නිශ්චිත රටේ නීතියෙහි යම් විධිවිධානයක් ;

(ඉ) සාක්ෂි ගත යුතු ආකාරය පිළිබඳව එහි ආවේශ්‍යතාවට අදාළව, නිශ්චිත රටේ නීතියෙහි විශේෂ අවශ්‍යතා කිසිවක් ;

(ඊ) ලේඛනයක මුල් පිටපත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ද නැතහොත්, ලේඛනයේ සහතික කළ පිටපතක් සෑහේ ද යන බව,

සඳහන් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාක්ෂි ගැනීමට හෝ ලේඛන හෝ වෙනත් භාණ්ඩ ඉදිරිපත් කිරීමට බලය දෙනු ලැබ ඇති අවස්ථාවක –

(අ) බලයදීමේ දී, සඳහන් කරනු ලැබ ඇති මහෙස්ත්‍රාත්වරයා මගින්, ඒ කරුණට අදාළව සාක්ෂි දීම සඳහා ඒ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටින එක් එක් සාක්ෂිකරුගේ සාක්ෂිය දිවුරුම් පිට ගනු ලැබිය හැකි අතර, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්,–

(i) සාක්ෂි ලිඛිතව ලබා ගැනීමට සලස්වා, සාක්ෂි ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ගනු ලැබූ බවට සහතික කරනු ලැබිය යුතු ය ; තවද,

(ii) එසේ සහතික කරනු ලැබූ සාක්ෂිය මධ්‍යම බලධරයා වෙත යැවීමට සලස්වනු ලැබිය යුතු ය.

(ආ) ලේඛන හෝ වෙනත් භාණ්ඩ තමා වෙත ඉදිරිපත් කළ යුතු යයි මහේස්ත්‍රාත්වරයකු විසින් නියම කරනු ලැබිය හැකි අතර, ලේඛන හෝ වෙනත් භාණ්ඩ එසේ ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් ලේඛන යැවිය යුතු අතර නැතහොත්, ඒ ලේඛන මධ්‍යම බලධරයා වෙත යැවීම ප්‍රායෝගික නොවන අවස්ථාවක හෝ ඉල්ලීම අදාළ වන්නේ ඒ ලේඛනවල පිටපත්වලට පමණක් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, මහේස්ත්‍රාත්වරයා විසින් සැබෑ පිටපත් බවට සහතික කරන ලද ඒ ලේඛනවල පිටපත් හෝ වෙනත් භාණ්ඩ මධ්‍යම බලධරයා වෙත යවනු ලැබිය හැකි ය.

(4) යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂි, නිශ්චිත රටේ නඩු කටයුත්ත අදාළ වන තැනැත්තා හෝ ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයකු වෙතොත් ඔහු ඉදිරියේ දී නැතහොත් ඔහු නොපැමිණ ඇති විටක දී ගනු ලැබිය හැකි ය.

(5) (3) වන උපවගන්තිය යටතේ නඩු කටයුත්තක් මෙහෙයවන මහේස්ත්‍රාත්වරයා විසින්,–

(අ) නිශ්චිත රටේ නඩු කටයුත්ත අදාළවන තැනැත්තාට ; හෝ

(ආ) නිශ්චිත රටේ නිසි බලධරයාට,

මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුත්තේ දී නීත්‍යනුකූල නියෝජනයක් ලබා ගැනීමට අවසර දිය යුතු ය.

(6) (3) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයාගේ සහතිකයෙන් ඒ වගන්තිය යටතේ පවත්වන ලද නඩු කටයුතුවල දී නීත්‍යනුකූල නියෝජනවලට අවකාශ ලබා දුන්නේ ද යන බව සහ සාක්ෂි ගනු ලැබූ අවස්ථාවේ දී හෝ ලේඛන හෝ වෙනත් භාණ්ඩ ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ දී පහත සඳහන් තැනැත්තන් අතුරෙන් යම් තැනැත්තකු පැමිණ සිටියේ ද යන බව ප්‍රකාශ විය යුතු ය :–

(අ) නිශ්චිත රටේ, නඩු කටයුත්ත අදාළ වන තැනැත්තා හෝ ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයකු ඇතොත්, ඔහු ;

(ආ) සාක්ෂි දෙනු ලබන හෝ ලේඛන හෝ වෙනත් භාණ්ඩ ඉදිරිපත් කරනු ලබන වෙනත් යම් තැනැත්තෙක් හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයකු ඇතොත්, ඔහු.

(7) සාක්ෂිකරුවන්ගේ පැමිණීම සහ සාක්ෂිකරුවන් විසින් ලේඛන ඉදිරිපත් කරනු ලැබීම බල කිරිමට අදාළ, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, ඒ සාක්ෂි ගැනිමට බලය දී ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(8) (3) වන උපවගන්තිය යටතේ තමා වෙත එවනු ලැබූ මහෙස්ත්‍රාත්වරයාගේ සහතිකය නිශ්චිත රටේ නිසි බලධරයා වෙත යැවීමට මධ්‍යම බලධරයා විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(9) නිශ්චිත රටක සාපරාධී කාරණාවකට අදාළ වූ නඩු කටයුත්තක කාර්ය සඳහා සාක්ෂි දීමට හෝ ලේඛන හෝ වෙනත් භාණ්ඩ ඉදිරිපත් කිරීමට නියමිත තැනැත්තකුට, නිශ්චිත රටේ ඒ නඩු කටයුත්තේ දී, අවස්ථාවෝචිත පරිදි, පිළිතුරු දීමට හෝ ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට බල නොකළ යුතු යම් ප්‍රශ්නයකට පිළිතුරු දීමට හෝ ලේඛනයක් හෝ භාණ්ඩයක් ඉදිරිපත් කිරීමට බල කරනු නොලැබිය යුතු ය.

(10) යථා පරිදි සැබෑ බවට සහතික කරන ලද විදේශ නීති නිර්මුක්තිය සහතිකයක්, මේ වගන්තිය යටතේ නඩු කටයුතුවල දී ඒ සහතිකයෙහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය. එහෙත්, නිසි බලධරයාගේ කැමැත්ත නොමැතිව, එය ඉල්ලීමෙහි සඳහන් සාපරාධී කාරණාව පිළිබඳ කාර්ය නොවන යම් කාර්යයක් සඳහා භාවිත කරනු නොලැබිය යුතු ය.

නිශ්චිත රටක දී සාක්ෂි ගැනීම හා ලේඛන ආදිය ඉදිරිපත් කිරීම සඳහා මධ්‍යම බලධරයා විසින් කරනු ලබන ඉල්ලීම.

11. (1) ශ්‍රී ලංකාව තුළ අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක ඉල්ලීම මත, මධ්‍යම බලධරයා විසින්,-

(අ) නිශ්චිත රටේ දී සාක්ෂි ගැනීම ; හෝ

(ආ) නිශ්චිත රටේ දී ලේඛන හෝ වෙනත් භාණ්ඩ ඉදිරිපත් කිරීම,

ඒ අධිකරණයේ සාපරාධී කාරණාවකට අදාළ නඩු කටයුත්තක කාර්ය සඳහා කටයුතු පිළියෙල කරන ලෙස නිශ්චිත රටක නිසි බලධරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් නිශ්චිත රටක නිසි බලධරයාගෙන්,–

(අ) ඒ නිශ්චිත රටේ දී ගනු ලැබූ යම් සාක්ෂියක් ;

(ආ) ඒ නිශ්චිත රටේ දී ඉදිරිපත් කරනු ලැබූ යම් ලේඛනයක් හෝ වෙනත් භාණ්ඩ,

මධ්‍යම බලධරයා වෙත ලැබුණු විටක දී, ඒ සාක්ෂිය, ලේඛනය හෝ භාණ්ඩය, ඒ ඉල්ලීම අදාළ වන්නා වූ යම් නඩු කටයුත්තක දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු මුත්, ඒ නිසි බලධරයාගේ කැමැත්ත නොමැතිව, ඒ ඉල්ලීමෙහි සඳහන් සාපරාධී කාරණාව පිළිබඳ කාර්ය නොවන කාර්යයක් සඳහා යොදා ගනු නොලැබිය යුතු ය.

## V වන කොටස

### සාක්ෂි දීම හෝ විමර්ශනවලට සහාය වීම සම්බන්ධයෙන් තැනැත්තන් වෙනුවෙන් කටයුතු පිළියෙල කිරීම

සාක්ෂි දෙන ලෙස හෝ විමර්ශනයක දී සහාය වන ලෙස ශ්‍රී ලංකාවේ සිටින සිරකරුවකු ගෙන් නිශ්චිත රටක් විසින් කරනු ලබන ඉල්ලීම.

**12.** (1) සාපරාධී කාරණාවකට සම්බන්ධ නඩු කටයුත්තක් හෝ විමර්ශනයක් නිශ්චිත රටක දී ආරම්භ වී ඇති විට සහ අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්ත සම්බන්ධයෙන් වූ විභාගයක දී සාක්ෂි දීමේ හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ සිටින සිරකරුවකුට අවස්ථාවෝචිත පරිදි ඒ නඩු කටයුත්තට අදාළව සාක්ෂි දීමේ හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීමේ හැකියාව ඇතැයි යන මතය ඇතිව, ශ්‍රී ලංකාවේ සිටින ඒ සිරකරු ඉවත් කර දෙන ලෙස ඒ නිසි බලධරයා ඉල්ලා සිටින්නා වූ ද අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින්,–

(අ) අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්තේ දී සාක්ෂි දීමට හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීමේ කාර්ය සඳහා ඒ නිශ්චිත රටට ඉවත්කරගෙන යාමට ඒ තැනැත්තා කැමැත්ත පළකර ඇති බවට ; සහ

(ආ) සිරකරුවා නිශ්චිත රටට ගෙන යාමේ දී හා ඒ සිරකරුවා නිශ්චිත රටේ අත් අඩංගුවේ තබාගත යුතු කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් යන වියදම් පියවා ගැනීමේ පොරොන්දු ද ඇතුළුව, ඒ සිරකරුවා සම්බන්ධයෙන් මධ්‍යම බලධරයා විසින් නියම කරනු ලබන පොරොන්දු කිසිවක් නිශ්චිත රට විසින් දෙනු ලැබ ඇති බවට,

සෑහීමට පත්වන්නේ නම්, නිශ්චිත රටට ඉවත්කර ගැනීමේ කාර්ය සඳහා ඒ සිරකරුවා බන්ධනාගාරයෙන් මුදා හැරිය යුතු ය යි ලියවිල්ලකින් විධාන කරනු ලැබිය හැකි අතර, ඒ සිරකරුවා නිශ්චිත රටට ගෙන යාම සඳහා කටයුතු පිළියෙල කරනු ලැබිය හැකි ය.

(2) සිරකරුවකු සම්බන්ධයෙන් (1) වන උප වගන්තිය යටතේ මධ්‍යම බලධරයා විසින් කරනු ලබන විධානයක්,–

(අ) ඒ සිරකරුවා අත්අඩංගුවේ තබා ගන්නා ලද බන්ධනාගාරයෙන් මුදාහැරීම සහ ඒ සිරකරුවා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර බන්ධනාගාර නිලධරයකුගේ භාරයෙන් ඒ සිරකරුවා ඉවත් කර ගතයුතු යයි ඉල්ලුම් කරන නිශ්චිත රටේ නිසි බලධරයා නියෝජනය කෙරෙන තැනැත්තකු භාරයට පත්කිරීම ;

(ආ) සිරකරුවා ශ්‍රී ලංකාවට ආපසු ගෙන ඒම සහ බන්ධනාගාර නිලධරයකුගේ භාරයෙන් නියමිත රටට ඉවත්කර ගෙන යාමේ කාර්යය සඳහා ඔහු මුදා හරිනු ලැබූ බන්ධනාගාරයේ භාරයට පත්කිරීම,

සම්බන්ධයෙන් බලය දෙන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ බන්ධනාගාරගත කාලයක් ගත කරන සිරකරුවකු (1) වන උපවගන්තිය යටතේ නිශ්චිත රටක් විසින් කරන ලද ඉල්ලීමකට අනුව බන්ධනාගාරයෙන් මුදා හරිනු ලැබූ අවස්ථාවක, ඒ ඉල්ලීම සම්බන්ධයෙන්, ඒ සිරකරුවා ඒ නිශ්චිත රටේ අත්අඩංගුවේ තබාගත් යම් කාලපරිච්ඡේදයක්, නිශ්චිත රටට ඉවත්කරගෙන යාම සඳහා ඔහු මුදා හැරීමට පෙරාතුව, ඔහු ගත කළ බන්ධනාගාරගත කාලයේ කාලපරිච්ඡේදයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (අ) සාපරාධී කාරණාවලට අදාළ නඩු කටයුත්තක් හෝ විමර්ශනයක් නිශ්චිත රටක ආරම්භවීම :

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්තට සම්බන්ධ විභාගයක දී හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ වෙසෙන (සිරකරුවකු නොවන) තැනැත්තකුගේ පැමිණීම නිශ්චිත රටේ මධ්‍යම බලධරයා විසින් ඉල්ලා සිටීම :

(ඇ) අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්තට අදාළව සාක්ෂි දීමේ හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීමේ හැකියාව ඒ තැනැත්තාට ඇතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්තා වූ ; සහ

(ඈ) (i) අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්තේ දී සාක්ෂි දීම සඳහා හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීම සඳහා ඒ නිශ්චිත රටට යාමට ඒ තැනැත්තා කැමැත්ත දී ඇති බවට ; සහ

(ii) ඒ තැනැත්තා නිශ්චිත රටට ගෙන යාමේ ගමන් වියදම් පියවීමේ පොරොන්දුව ද ඇතුළුව, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මධ්‍යම බලධරයාට අවශ්‍ය යම් පොරොන්දුවක් නිශ්චිත රටේ නිසි බලධරයා දී ඇති බවට,

මධ්‍යම බලධරයා සෑහීමට පත් වූ අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින්, ස්වකීය අභිමතය පරිදි, නිශ්චිත රටට ඒ තැනැත්තාගේ ගමන යාම සඳහා කටයුතු පිළියෙල කරනු ලැබිය හැකි ය.

සාක්ෂි දෙන ලෙස හෝ විමර්ශනයක දී සහායවන ලෙස නිශ්චිත රටක සිරකරුවකු හෝ වෙනත් තැනැත්තකු ගෙන් මධ්‍යම බලධරයා විසින් කරනු ලබන ඉල්ලීම.

**13.** (1) සාපරාධී කාරණාවකට අදාළ නඩු කටයුත්තක් හෝ විමර්ශනයක් ශ්‍රී ලංකාවේ දී ආරම්භ වී ඇති විට සහ නිශ්චිත රටක වෙසෙන තැනැත්තකු–

(අ) ඒ නිශ්චිත රටේ සිරකරුවකු බවට :

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්තට අදාළව සාක්ෂි දීමේ හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීමේ හැකියාව ඇති බවට ; සහ

(ඇ) අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්තේ දී සාක්ෂි දීමේ හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවට ගෙන යාමට කැමැත්ත දී ඇති බවට හෝ කැමැත්ත දීමට අවකාශ ඇති බවට,

මධ්‍යම බලධරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින් ස්වකීය අභිමතය පරිදි, අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්ත සම්බන්ධ විභාගයක දී සාක්ෂි දීම සඳහා හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීම සඳහා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට ගෙන ඒමේ බලය දෙන ලෙස නිශ්චිත රටේ නිසි බලධරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම බලධරයා විසින් කරන ලද ඉල්ලීමකට අනුව, නිශ්චිත රටකින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබූ තැනැත්තකු ඒ ඉල්ලීමට අනුව ශ්‍රී ලංකාවේ සිටිය දී හෝ ශ්‍රී ලංකාවට හෝ ශ්‍රී ලංකාවෙන් ගමන් කරමින් සිටිය දී, මධ්‍යම බලධරයා විසින් ලියවිල්ලකින් විධාන කරනු ලැබිය හැකි පරිදි අත්අඩංගුවේ තබාගත යුතු ය. මේ උපවගන්තිය යටතේ දෙනු ලැබූ විධානයක්, විධානය අදාළ වන තැනැත්තා අත්අඩංගුවේ තබාගැනීමට කාලය දී ඇති පරිද්දෙන් සලකනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ බන්ධනාගාරයක් තුළ බන්ධනාගාරගත කරනු ලැබූ තැනැත්තන්ගේ බන්ධනාගාරගත කිරීම පිළිබඳ කොන්දේසි, බන්ධනාගාරගත කාලය තුළ දී ඔවුන්ට දැක් වූ සැලකිල්ල, සහ බන්ධනාගාරයකින් බන්ධනාගාරයකට සිදු කරනු ලබන ඔවුන්ගේ මාරු කිරීම්වලට අදාළ, බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන, (2) වන උපවගන්තිය යටතේ මධ්‍යම බලධරයා විසින් දෙන ලද විධානයකට අනුව අත්අඩංගුවේ පසුවන තැනැත්තකු සම්බන්ධයෙන්, ඒවා අදාළ කළ හැකි තාක් දුරට අදාළ කරනු ලැබිය යුතු ය.

(4) (අ) (2) වන උපවගන්තිය යටතේ මධ්‍යම බලධරයා විසින් කරන ලද විධානයකට අනුව තැනැත්තකු අත්අඩංගුවේ පසුවන ; සහ

(ආ) ඒ තැනැත්තා ශ්‍රී ලංකාවට ඉවත් කරනු ලැබූ නිශ්චිත රටේ නිසි බලධරයා විසින්, ඒ තැනැත්තා අත්අඩංගුවෙන් මුදවාහරින ලෙස ඉල්ලා සිටිනු ලැබූ

අවස්ථාවක, ඒ තැනැත්තා අත්අඩංගුවෙන් මුදාහැරිය යුතු යයි මධ්‍යම බලධරයා විසින් විධාන කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම බලධරයා විසින් කරන ලද ඉල්ලීමකට අනුව, ශ්‍රී ලංකාවේ අත්අඩංගුවේ පසුවන අතරතුර නීත්‍යනුකූල අත්අඩංගුවෙන් පලායන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, බරපතල වැඩ ඇතිව අවුරුදු දහයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(6) සාපරාධී කාරණාවකට අදාළ නඩු කටයුත්තක් හෝ විමර්ශනයක් ශ්‍රී ලංකාවේ දී, ආරම්භ වී ඇති විට සහ නිශ්චිත රටක වාසය කරන, (සිරකරුවකු නොවන) තැනැත්තකුට,–

(අ) අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්තට අදාළව සාක්ෂි දීමේ හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීමේ හැකියාව ඇති බවට ; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු කටයුත්තේ දී සාක්ෂි දීම සඳහා හෝ ඒ විමර්ශනයට අදාළව සහාය දීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට ඒ තැනැත්තා කැමැත්ත පළ කර ඇති බවට,

මධ්‍යම බලධරයාගේ මතය වූ අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින් ස්වකීය අභිමතය පරිදි, ඒ තැනැත්තාගේ ශ්‍රී ලංකා ගමන සඳහා කටයුතු පිළියෙල කරන ලෙසට නිශ්චිත රටේ නිසි බලධරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

ශ්‍රී ලංකාවට ගෙනෙන ලද තැනැත්තන්ට එරෙහිව නඩු පැවරීම් ආදියෙන් නිර්මුක්තිය.

14. සාපරාධී කාරණාවකට අදාළ නඩු කටයුත්තක දී සාක්ෂි දීම සඳහා හෝ සාපරාධී කාරණාවකට අදාළ විමර්ශනයක දී සහාය දීම සඳහා,–

(අ) 13 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ මධ්‍යම බලධරයා විසින් නිශ්චිත රටක නිසි බලධරයා වෙත කරන ලද ඉල්ලීමකට අනුව තැනැත්තකු ශ්‍රී ලංකාවේ සිටින ; නැතහොත්,

(ආ) 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම බලධරයා විසින් නිශ්චිත රටක නිසි බලධරයා වෙත කරන ලද ඉල්ලීමකට අනුව, සිරකරුවකු වන තැනැත්තකු ශ්‍රී ලංකාවට ඉවත් කරනු ලැබූ,

අවස්ථාවක,–

(i) සාපරාධී කාරණාවකට අදාළ නඩු කටයුත්තක දී, සාක්ෂි දීමේ හෝ සාපරාධී කාරණාවකට අදාළ විමර්ශනයක දී සහාය වීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ සිටින සිරකරුවකු නොවන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තා ඒ නඩු කටයුත්ත හෝ විමර්ශනය සඳහා පෙනී සිටීම අවශ්‍ය නොවන බව මධ්‍යම බලධරයා විසින් ඔහු වෙත දැනුම් දීමෙන් හා ශ්‍රී ලංකාවෙන් ඉවත්ව යාමට අවස්ථාවක් ඔහුට ලැබීමෙන් පසු, ඒ තැනැත්තා යථාතේ පිරිසෙයින් දින පහළොවක කාලපරිච්ඡේදයක්වත් ශ්‍රී ලංකාවේ නතර වී සිටියේ නම් මිස : සහ

(ii) සාපරාධී කාරණාවකට අදාළ නඩු කටයුත්තක දී සාක්ෂි දීමේ හෝ සාපරාධී කාරණාවකට අදාළ විමර්ශනයක දී සහාය වීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ සිටින සිරකරුවකු වන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු ශ්‍රී ලංකාවට ඉවත් කරනු ලැබූ නිශ්චිත රටට ආපසු යනතුරු,

ඒ ඉල්ලීමට අනුව, ඒ නිශ්චිත රටෙන් ඒ තැනැත්තා නික්ම යාමට පෙර, කරන ලදැයි කියනු ලබන හෝ කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා රඳවා තැබීම, ඔහුට එරෙහිව නඩු පැවරීම හෝ දඬුවම් පැමිණවීම කරනු නොලැබිය යුතු ය.

## VI වන කොටස

## සෝදිසි කිරීම සහ තහනමට ගැනීම සම්බන්ධයෙන් සහායවීම

සෝදිසි කිරීම සහ තහනමට ගැනීම සඳහා නිශ්චිත රටක ඉල්ලීම.

15. (1) (අ) බරපතල වරදක් ඇතුළත් වන සාපරාධී කාරණයක් සම්බන්ධ නඩු කටයුත්තක් හෝ විමර්ශනයක් නිශ්චිත රටක ආරම්භ වී ඇති විට ;

(ආ) එම නඩු කටයුත්තට හෝ විමර්ශනයට අදාළ යම් දෙයක් ශ්‍රී ලංකාව තුළ ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්තා වූ ද ; සහ

(ඇ) එම දෙය හා සම්බන්ධව සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීම සඳහා කටයුතු පිළියෙල කරන ලෙස ඒ නිශ්චිත රටෙහි නිසි බලධරයා විසින් මධ්‍යම බලධරයාගෙන් ඉල්ලා සිටිනු ලබන්නා වූ ද,

අවස්ථාවක, ඒ නිශ්චිත රටෙහි නිසි බලධරයා විසින් ඉල්ලුම් කර තිබෙන සෝදිසි වරෙන්තුව සඳහා, ඒ දෙය ඇතැයි විශ්වාස කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බල ප්‍රදේශය ඇතුළත ද ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස, මධ්‍යම බලධරයා විසින්, ඔහුගේ අභිමතය පරිදි, පොලිස් නිලධරයකුට ලිඛිතව බලය දෙනු ලැබිය හැකි ය.

(2) එම ඉල්ලීම අදාළ වන දෙය යම් නිශ්චිත වේලාවක ඇත්තේ හෝ තිබිය යුත්තේ —

(අ) යම් තැනැත්තකු ඇඳ සිටින වස්ත්‍රයක බව ; හෝ

(ආ) අන්‍යාකාරව, යම් තැනැත්තකුගේම අප්‍රමාද පාලනය යටතේ බව,

(1) වන උපවගන්තිය යටතේ බලය දෙනු ලැබූ නිලධරයකුට විශ්වාස කිරීමට හේතු ඇති අවස්ථාවක, ඒ පොලිස් නිලධරයා විසින් —

(i) එසේ විශ්වාස කිරීමට පවත්නා හේතු ගෙනහැර දක්වමින්, එම තොරතුරු දිවුරුම් පිට ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය ; තව ද

(ii) ඒ දෙය සඳහා ඒ තැනැත්තා සෝදිසි කිරීම පිණිස මේ වගන්තිය යටතේ වරෙන්තුවක් නිකුත් කරන ලෙස ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ විට, අවශ්‍ය සාධාරණ සහාය ඇතිව හා බලය පාවිච්චි කර –

(අ) ඒ දෙය සඳහා ඒ තැනැත්තා සෝදිසි කිරීමට ; සහ

(ආ) තහනමට ගැනීමට වරෙන්තුවෙන් බලය දී ඇත්තා වූ සහ එම සෝදිසියේ දී සොයාගනු ලබන්නා වූ ද නඩු කටයුත්තට හෝ විමර්ශනයට අදාළ බවට සාධාරණ හේතු මත පොලිස් නිලධරයා විශ්වාස කරන්නා වූ ද යම් දෙයක් තහනමට ගැනීමට,

(වරෙන්තුවේ නම් කර ඇති හෝ නොමැති) පොලිස් නිලධරයකුට බලය දෙන වරෙන්තුවක්, (6) වන උපවගන්තියට යටත්ව මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) එම ඉල්ලීම අදාළවන දෙය, යම් නිශ්චිත වේලාවක ඇත්තේ හෝ තිබිය යුත්තේ යම් ඉඩමක හෝ යම් පරිශ්‍රයක් මත හෝ තුළ බව විශ්වාස කිරීමට (1) වන උපවගන්තිය යටතේ බලය දෙනු ලැබූ යම් පොලිස් නිලධරයකුට විශ්වාස කිරීමට හේතු ඇති අවස්ථාවක –

(අ) එසේ විශ්වාස කිරීමට පවත්නා හේතු ගෙනහැර දක්වමින් එම තොරතුරු, දිවුරුම් පිට ඒ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය ; තව ද

(ආ) ඒ දෙය සඳහා ඒ ඉඩම හෝ පරිශ්‍රය සෝදිසි කිරීම පිණිස මේ වගන්තිය යටතේ වරෙන්තුවක් නිකුත් කරන ලෙස ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ විට, අවශ්‍ය හා සාධාරණ සහාය ඇතිව හා බලය පාවිච්චි කර –

(අ) එම ඉඩමට හෝ එම පරිශ්‍රය මතට හෝ තුළට ඇතුළු වීමට ;

(ආ) ඒ දෙය සඳහා එම ඉඩම හෝ පරිශ්‍රය සෝදිසි කිරීමට ; සහ

(ඇ) තහනමට ගැනීමට වරෙන්තුවෙන් බලය දී ඇත්තා වූ සහ එම සෝදිසිය කරගෙන යාමේ දී සොයාගනු ලබන්නා වූ ද නඩු කටයුත්තට හෝ විමර්ශනයට අදාළ බවට සාධාරණ හේතු මත පොලිස් නිලධරයා විශ්වාස කරන්නා වූ ද යම් දෙයක් තහනමට ගැනීමට,

(වරෙන්තුවේ නම් කර ඇති හෝ නොමැති) පොලිස් නිලධරයකුට බලය දෙන වරෙන්තුවක්, (6) වන උපවගන්තියට යටත්ව මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

(6) (අ) වරෙන්තුව නිකුත් කරන ලෙස ඉල්ලා සිටින හේතු සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා ඉල්ලා සිටින වැඩිදුර තොරතුරු කිසිවක් ඇත්නම්, දැනුම් දෙන්නා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ඒ තොරතුරු, වාචිකව හෝ දිවුරුම් පත්‍රයක් මගින් හෝ මහෙස්ත්‍රාත්වරයාට දී ඇත්නම් මිස ; සහ

(ආ) වරෙන්තුවක් නිකුත් කිරීම සඳහා සාධාරණ හේතු පවත්නා බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම් මිස,

මහෙස්ත්‍රාත්වරයා විසින් මේ වගන්තිය යටතේ වරෙන්තුවක් නිකුත් නොකළ යුතු ය.

(7) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන වරෙන්තුවක -

(අ) සෝදිසි කිරීම සඳහා බලය දෙනු ලබන්නේ යම් සාපරාධී කාරණයක් සම්බන්ධයෙන් ද ඒ කාරණයෙහි ස්වභාවය ගැන සඳහනක් ද ඇතුළුව, ඒ වරෙන්තුව නිකුත් කරනු ලබන කාර්යය ;

(ආ) එම සෝදිසිය දිවා රාත්‍රී කවර හෝ වේලාවක සිදු කිරීම සඳහා නැතහොත් දහවල් හෝ රාත්‍රි යම් නිශ්චිත වේලාවක සිදු කිරීම සඳහා බලය දෙනු ලබන්නේ ද යන වග ;

(ඇ) තහනමට ගැනීමට බලය දෙනු ලබන දේවල්වල ආකාරය පිළිබඳ විස්තරයක් ; සහ

(ඈ) එම වරෙන්තුවේ බලාත්මක භාවය නතර වන (වරෙන්තුව නිකුත් කළ දිනයට මාසයකට වඩා පසු නොවන) දිනය,

ප්‍රකාශව තිබිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවක් යටතේ, ඒ වරෙන්තුවේ නිශ්චිතව සඳහන් ආකාරයේ යම් දෙයක් සඳහා සෝදිසියක් පවත්වන අතරතුර –

(අ) නිශ්චිත රටෙහි පැවැත්වෙන නඩු කටයුත්තට හෝ විමර්ශනයට හෝ ශ්‍රී ලංකාවෙහි වරදක් සිදු කිරීම පිළිබඳ සාක්ෂියක් වශයෙන් හෝ අදාළ වන ; සහ

(ආ) තහනමට ගනු නොලැබුවහොත් සඟවනු ලැකීමට, නැතිවීමට හෝ විනාශ කරනු ලැබීමට ඉඩ ඇති,

සාධාරණ හේතු මත පොලිස් නිලධරයා විශ්වාස කරන වෙනත් යම් දෙයක් සොයා ගනු ලැබුවහොත්, ඒ වෙනත් දෙය තහනමට ගැනීමට එම වරෙන්තුවෙන් ඒ පොලිස් නිලධරයාට බලය පැවරෙන සේ සලකනු ලැබිය යුතු ය.

(9) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවකට අනුකූලව පැවැත්වෙන සෝදිසියක ප්‍රතිඵලයක් වශයෙන් පොලිස් නිලධරයකු විසින්, නිශ්චිත රටෙහි නඩු කටයුත්තට හෝ විමර්ශනයට අදාළ බවට ඒ පොලිස් නිලධරයා සාධාරණ හේතු මත විශ්වාස කරන වෙනත් යම් දෙයක් සොයාගනු ලැබුවහොත් ඒ පොලිස් නිලධරයා විසින් ඒ වෙනත් දෙය ශ්‍රී ලංකාවේ පොලිස්පතිවරයාගේ භාරය හා පාලනය යටතට භාර දිය යුතු ය.

(10) යම් දෙයක්, (9) වන උපවගන්තිය යටතේ පොලිස්පතිවරයාගේ භාරය සහ පාලනය යටතට භාරදෙනු ලැබූ අවස්ථාවක, එය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව, එය නිශ්චිත රටක බලධරයකු වෙත යවන ලෙසට විධානයක් ද ඇතුළත් විය හැකි ලියවිල්ලකින් වූ විධානයක්

මධ්‍යම බලධරයාගෙන් ලැබීමේ බලාපොරොත්තුවෙන්, එය තහනමට ගනු ලැබූ දින සිට එක් මාසයක් නොඉක්මවන කාලයක් එය තබා ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු පිළියෙල කරනු ලැබිය යුතු ය.

(11) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ නිකුත් කරන ලද සෝදිසි වරෙන්තු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඒ පනතේ විධිවිධාන, මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(12) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවකට අනුකූලව සිදු කරන ලද සෝදිසි කිරීමක දී තහනමට ගන්නා ලද යම් දෙයක්, එය තහනමට ගන්නා ලද ස්ථානය සහ තහනමට ගැනීමට අදාළ අවස්ථාගත කරුණු හා එය තහනමට ගැනීමෙන් පසු එහි භාරකාරත්වය දැක්වෙන සහතිකයක් ද සමග, එම වරෙන්තුව නිකුත් කළ මහෙස්ත්‍රාත්වරයා විසින්, (9) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව එම සෝදිසි වරෙන්තුව සඳහා ඉල්ලීම කළ රටෙහි නිසි බලධරයා වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

සෝදිසි කර ගැනීම සහ තහනමට ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඉල්ලීම.

**16.** සාපරාධී කාරණයක් සම්බන්ධ නඩු කටයුත්තක් හෝ විමර්ශනයක් ශ්‍රී ලංකාවෙහි ආරම්භ කර ඇති විට සහ එම නඩු කටයුත්තට හෝ විමර්ශනයට අදාළ යම් දෙයක් යම් නිශ්චිත රටක තිබෙන බව විශ්වාස කිරීමට මධ්‍යම බලධරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඒ දෙය හෝ ඒ නඩු කටයුත්තට හෝ විමර්ශනයට අදාළ වන හෝ අදාළ විය හැකි වෙනත් යම් දෙයක් සඳහා සෝදිසි කර ඒවා තහනමට ගැනීමට බලය දෙන වරෙන්තුවක් හෝ වෙනත් අධිකාර බලයක් ඉල්ලුම් කර ලබාගන්නා ලෙස සහ ඒ වරෙන්තුවෙන් බලය දෙන ලද සෝදිසිය කරගෙන යාමේ දී තහනමට ගන්නා කවර හෝ දෙයක් තමා වෙත එවන ලෙස, මධ්‍යම බලධරයා විසින් ඒ නිශ්චිත රටෙහි නිසි බලධරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

## VII වන කොටස

### අපරාධ මගින් උපයාගත් දේ සොයා ගැනීම සහ ආඥා බලාත්මක කිරීම.

අපරාධ මගින් උපයාගත් දේ සොයා ගැනීම සඳහා නිශ්චිත රටක ඉල්ලීම.

17. (අ) යම් තැනැත්තකු විසින් නිශ්චිත රටක යම් බරපතල වරදක් සිදු කර ඇති බවට චෝදනා කරනු ලැබ හෝ යම් බරපතල වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබ හෝ බරපතල වරදක් සම්බන්ධයෙන් සාධාරණ හේතු මත සැක කරනු ලැබ ඇත්තා වූ ද ;

(ආ) ඒ වරද සිදු කිරීමෙන් සෘජුවම හෝ වක්‍රව ලබාගෙන තිබෙන යම් දේපළක් ශ්‍රී ලංකාවෙහි තිබෙන බැව් විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්තා වූ ද ;

(ඇ) ඒ දේපළ හඳුනාගැනීම, පිහිටි තැන සොයා ගැනීම හෝ එහි වටිනාකම තක්සේරු කිරීම සඳහා සහාය වන ලෙස ඒ නිශ්චිත රටෙහි නිසි බලධරයා විසින් මධ්‍යම බලධරයාගෙන් ඉල්ලා ඇත්තා වූ ද,

අවස්ථාවක, එම සහාය දීම ප්‍රායෝගිකව කළ හැකි නම්, එසේ ඉල්ලා සිටින සහාය මධ්‍යම බලධරයා විසින් ඔහුගේ අභිමතය පරිදි දෙනු ලැබිය හැකි ය.

අපරාධ මගින් උපයාගත් දේ සොයා ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් කරනු ලබන ඉල්ලීම.

18. (අ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙහි යම් බරපතල වරදක් සිදු කර ඇති බවට චෝදනා කරනු ලැබ හෝ යම් බරපතල වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබ හෝ බරපතල වරදක් සම්බන්ධයෙන් සාධාරණ හේතු මත සැක කරනු ලැබ ඇත්තා වූ ද ;

(ආ) ඒ වරද සිදු කිරීමෙන් සෘජුවම හෝ වක්‍රව ලබාගෙන තිබෙන යම් දේපළක් නිශ්චිත රටක තිබෙන බැව් විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්තා වූ ද,

අවස්ථාවක, එම දේපළ හඳුනාගැනීමෙහි, පිහිටි තැන සොයා ගැනීමෙහි හෝ එහි වටිනාකම තක්සේරු කිරීමෙහි ලා සහාය වන ලෙස, මධ්‍යම බලධරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ඒ නිශ්චිත රටෙහි සිටින බලධරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

අධිකරණ ආඥා බලාත්මක කරන ලෙස නිශ්චිත රටක් විසින් කරන ඉල්ලීම්.

19\. (1) (අ) නිශ්චිත රටක අධිකරණයක් විසින්, සාපරාධී කාරණයක් සම්බන්ධ නඩු කටයුත්තක දී –

(i) යම් දේපළක් අහිමි කරන හෝ යම් දේපළක් අහිමි කිරීමේ හෝ රජය සන්තක කිරීමේ ප්‍රතිඵලය ඇති ආඥාවක් ;

(ii) යම් තැනැත්තකුට දඩයක් නියම කිරීමේ හෝ වෙනත් මූල්‍යමය දණ්ඩනයක් හෝ වෙනත් යම් තැනැත්තකුට වන්දි ගෙවන ලෙස අදාළ තැනැත්තාට නියම කරන ආඥාවක් ;

(iii) යම් තැනැත්තකු විසින් හෝ සියලු තැනැත්තන් විසින් හෝ යම් දේපළක් සම්බන්ධ ගනුදෙනු කිරීම වළක්වන ආඥාවක්,

කරනු ලැබ ඇත්තා වූ :

(ආ) ඒ ආඥාව කර ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළ ශ්‍රී ලංකාවේ තිබෙන බව හෝ එම ආඥාව සංතෘප්ත කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති යම් දේපළක් ලබා ගත හැකි බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්තා වූ ;

(ඇ) ඒ ආඥාව ශ්‍රී ලංකාවෙහි බලාත්මක කිරීම පිණිස සහාය වන ලෙස මධ්‍යම බලධරයාගෙන් ඒ නිශ්චිත රටේ සිටි බලධරයා ඉල්ලීමක් කර ඇත්තා වූ : සහ

(ඈ) ඒ ආඥාව බලාත්මකව පවතින බවට හා එම නිශ්චිත රටෙහි යම් වැඩිදුර අභියාචනයකට යටත්ව නොමැති බවට මධ්‍යම බලධරයා සෑහීමට පත්වන්නා වූ,

අවස්ථාවක, ඒ ආඥාව, ඒ දේපළ ඇති පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති මහාධිකරණයේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන ලෙස, මධ්‍යම බලධරයා විසින්, ඔහුගේ අභිමතය පරිදි නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලය දීමක් ප්‍රකාර ආඥාවක් ලියාපදිංචි කිරීම සඳහා නීතිපතිවරයා විසින් මහාධිකරණයෙන් ඉල්ලුම් කරනු ලැබූ අවස්ථාවක, ඒ අධිකරණය විසින් ඒ ආඥාව ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාර, ආඥාවක් මහාධිකරණයේ ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක, (ලියාපදිංචි කිරීමට පෙර වූවද පසුව වූවද) ඒ ආඥාවෙහි කරන සංශෝධනවල පිටපතක් ආඥාව ලියාපදිංචි කළ ආකාරයෙන්ම ලියාපදිංචි කළ යුතු අතර එම සංශෝධන එසේ ලියාපදිංචි කරනු ලැබීමෙන් පසුව පමණක් බලපැවැත්විය යුතු ය.

(4) ආඥාවක් හෝ ආඥාවක සංශෝධනයක් 21 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යථාපරිදි සැබෑ බවට සහතික කළ ආඥාවේ හෝ සංශෝධනයේ පිටපතක් සමග තත් කාර්යය සඳහා සාදන ලද යම් අධිකරණ රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් මහාධිකරණයෙහි ලියාපදිංචි කිරීමෙන්, සිදුකරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ මහාධිකරණයෙහි ලියාපදිංචි කරන ලද ආඥාවක් හෝ ආඥාවක යම් සංශෝධන, සෑම අනකින්ම, ඒ අධිකරණය විසින් කරන ලද ආඥාවක් වූවාක් සේ, බලපැවැත්විය යුතු අතර, එසේ බලාත්මක කරනු ලැබිය හැකි ය.

(6) (2) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද යම් ආඥාවක්, ඒ ආඥාව කරනු ලැබූ නිශ්චිත රටෙහි බලපැවැත්වීම නතර වී ඇති බවට මහාධිකරණය සෑහීමට පත්වී ඇති අවස්ථාවක, එම ලියාපදිංචිය මහාධිකරණය විසින් අවලංගු කරනු ලැබිය යුතු ය.

(7) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද ආඥාවක් බලාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අහිමි කරන ලද හෝ රජය සන්තක කරන ලද යම් දේපළක් සම්බන්ධයෙන් හෝ අයකර ගන්නා ලද දඩයක්, මූල්‍ය දණ්ඩනයක් හෝ වන්දියක් සම්බන්ධයෙන්, එම ඉල්ලීම ක්‍රියාවේ යෙදීමේ කාර්යය සඳහා මධ්‍යම බලධරයා නිශ්චිතව නියම කරන යම් ආකාරයකින් කටයුතු කරනු ලැබිය හැකි ය.

අධිකරණ ආඥා බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් කරන ඉල්ලීම්.

20. (අ) ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින්, සාපරාධී කාරණයක් සම්බන්ධ නඩු කටයුත්තක දී –

(i) යම් දේපළක් අහිමි කරන හෝ යම් දේපළක් අහිමි කිරීමේ හෝ රජය සන්තක කිරීමේ ප්‍රතිඵලය ඇති හෝ ආඥාවක් ;

(ii) යම් තැනැත්තකුට දඩයක් නියම කිරීමේ ආඥාවක් හෝ වෙනත් මූල්‍යමය දණ්ඩනයක් හෝ වෙනත් යම් තැනැත්තකුට වන්දි ගෙවන ලෙස අදාළ තැනැත්තාට නියම කරන ආඥාවක් ;

(iii) යම් තැනැත්තකු විසින් හෝ සියලු තැනැත්තන් විසින් හෝ යම් දේපළක් සම්බන්ධ ගනුදෙනු කිරීම වළක්වන ආඥාවක්,

කරනු ලැබ ඇත්තා වූ ද ; සහ

(ආ) ඒ ආඥාව කර ඇත්තේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළ නිශ්චිත රටක තිබෙන බව හෝ එම ආඥාව සංතෘප්ත කිරීම සඳහා යොදාගත හැකි දේපළ නිශ්චිත රටක තිබෙන බව මධ්‍යම බලධරයාට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්තා වූ ද, අවස්ථාවක,

ඒ නිශ්චිත රටෙහි ඒ ආඥාව බලාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල සකස් කරන ලෙස, මධ්‍යම බලධරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ඒ නිශ්චිත රටෙහි නිසි බලධරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

## VIII වන කොටස

### සාමාන්‍ය

ලේඛන සැබෑ බවට සහතික කිරීම.

**21.** (1) මේ පනත යටතේ කරන ඉල්ලීමක් අනුව සෘජුවම හෝ වක්‍රව උද්ගතවන මේ පනත යටතේ වූ නඩු කටයුත්තක දී, යථා පරිදි සැබෑ බවට සහතික කරන ලද ලේඛනයක්, සාක්ෂියේ දී ආවේශ්‍ය කර ගනු ලැබිය හැකි ය.

(2) ලේඛනයක්–

(අ) නිශ්චිත රටක හෝ නිශ්චිත රටකට අයත් විනිශ්චයකාරවරයකු, මහේස්ත්‍රාත්වරයකු හෝ නිලධරයකු විසින් අත්සන් කර හෝ සහතික කර ඇති බවට උද්දේශනය කරන්නේ නම් ; සහ

(ආ) නිශ්චිත රටෙහි සාක්ෂිකරුවකු හෝ දිවුරුම පිට සැබෑ බවට සහතික කර තිබෙන හෝ එම රටෙහි ආණ්ඩුවේ නිලධරයකුගේ දිවුරුම පිට සැබෑ බවට සහතික කර තිබෙන බවට නැතහොත් නිශ්චිත රටෙහි රාජ්‍ය මුද්‍රාවෙන් හෝ නිශ්චිත රටෙහි රාජ්‍ය අමාත්‍යවරයකුගේ හෝ දෙපාර්තමේන්තුවක හෝ නිලධරයකුගේ මුද්‍රාවෙන් සැබෑ බවට සහතික කර තිබෙන බව උද්දේශනය කරන්නේ නම්,

ඒ ලේඛනය (1) වන උපවගන්තියේ කාර්ය සඳහා යථා පරිදි සැබෑ බවට සහතික කර තිබෙන සේ සැලකිය යුතු ය.

නියෝග.

**22.** (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ අවශ්‍ය විය හැකි සියලුම කාරණා සඳහා හෝ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයෙහි නිශ්චය කොට දැක්වෙන යම් පසු දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමතිය සඳහා පාර්ලිමේන්තුව හමුවට පමුණුවනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ සෑම නියෝගයක් ම ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**23.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**24.** පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, මේ පනතෙහි–

"නිසි බලධරයා" යන්න, නිශ්චිත රටක් සම්බන්ධව යෙදෙන විට, ඒ රට–

(අ) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් නම් ඒ රටෙහි යම් නීතියක් මගින් හෝ යටතේ සාපරාධී කාරණා සම්බන්ධයෙන් සහාය ඉල්ලා ලැබෙන ඉල්ලීම් භාරගෙන, ප්‍රේෂණය කිරීම සඳහා නම් කරනු ලැබ සිටින, කවර වූ හෝ ආකාරයකින් විස්තර කෙරෙන තැනැත්තා අදහස් වේ ;

(ආ) පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් නොවන රටක් නම්, ශ්‍රී ලංකාව සහ පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් නොවන ඒ රට අතර, සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගය සම්බන්ධයෙන් ඇතුළත් වී තිබෙන යම් ගිවිසුමක් අනුව හෝ ඒ ගිවිසුම බලාත්මක කරන ඒ රටෙහි යම් නීතියක් අනුව, සහාය ඉල්ලා ලැබෙන ඉල්ලීම් භාරගෙන ප්‍රේෂණය කිරීම සඳහා නම් කරනු ලැබ සිටින, කවර වූ හෝ ආකාරයකින් විස්තර කෙරෙන තැනැත්තා අදහස් වේ ;

"පොදු රාජ්‍ය මණ්ඩලීය රට" යන්නෙන්, පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටක් අදහස් වන අතර එයට ඒ රටෙහි විජිතයක්, දේශභූමියක්, ආරක්ෂිත දේශයක් හෝ වෙනත් උපජීවී රටක් හෝ ඒ රටෙහි ලියාපදිංචි නැවක් හෝ ගුවන් යානයක් අදහස් වේ ;

"සාපරාධී කාරණය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ වුවද නිශ්චිත රටක වුවද යම් නීතියක් උල්ලංඝනය කිරීම අදහස් වන අතර එයට බදු අයකිරීම, විනිමය පාලනය, රේගු හෝ සුරැකුම්පත් හෝ අයථා මුදල් යථාවත් කිරීමට අදාළව ශ්‍රී ලංකාවේ හෝ නිශ්චිත රටක හෝ නීතිය උල්ලංඝනය කිරීම ඇතුළත් වේ ;

"යථා පරිදි සැබෑ බවට සහතික කළ" යන්න, ලේඛනයක් සම්බන්ධව යෙදෙන විට, 21 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි සැබෑ බවට සහතික කරන ලද ලේඛනයක් අදහස් වේ ;

"විදේශීය නීතියෙන් මුක්ති සහතිකය" යන්නෙන්, යම් නිශ්චිත රටක නීතිය යටතේ පොදුවේ පුද්ගලයන් විසින් හෝ නිශ්චිත පුද්ගලයකු විසින් හෝ පොදුවේ හෝ නිශ්චිත නීති කෘත්‍යයක දී හෝ පොදුවේ නැතහොත් නිශ්චිත අවස්ථාගත තත්වයක දී නිශ්චිත ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ නිශ්චිත ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ කරනු ලැබිය හැකි ද නොහැකි ද යන බවට ඒ නිශ්චිත රටෙහි නිසි බලධරයා විසින් හෝ ඒ රටෙහි නීතිය යටතේ හෝ දෙන ලද සහතිකයක් හෝ කරන ලද ප්‍රකාශයක් අදහස් වේ ;

"පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් නොවන රට" යන්නෙන්, පොදු රාජ්‍ය මණ්ඩලයෙන් බාහිර රටක් අදහස් වන අතර එයට ඒ රටෙහි විජිතයක්, දේශභූමියක්, ආරක්ෂිත දේශයක් හෝ වෙනත් උපජීවී රටක් හෝ ඒ රටෙහි ලියාපදිංචි නැවක් හෝ ගුවන් යානයක් අදහස් වන අතර, මහජන චීන සමූහාණ්ඩුවේ හොංකොං විශේෂ පරිපාලන කලාපය ඊට ඇතුළත් වන සේ සැලකිය යුතු ය ;

"බරපතල වරද" යන්නෙන්, මරණීය දණ්ඩනයෙන් හෝ එක් අවුරුද්දකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් අදහස් වේ.

**උපලේඛනය** **(5 වන වගන්තිය)**

**අ ආකෘති පත්‍රය**

**(7(1) වගන්තිය)**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙනට ය.

.................................................................................................
යන ඇය (සැකකරුගේ/සාක්ෂිකරුගේ/වෙනත් යම් තැනැත්තකුගේ* නම දන්නේ නම් සඳහන් කරන්න) ............................................................ යන කාරණයට (නිශ්චිත රටෙහි අපරාධ අධිකරණයේ අධිකරණ බලය ඇතුළතට ගැනෙන සාපරාධී කාරණය සඳහන් කරන්න.) සම්බන්ධ බවට සැක කරනු ලබන හෙයින් ද/ඒ කාරණය සම්බන්ධයෙන් සාක්ෂි දීමට/සහාය වීමට* ඒ තැනැත්තාට හැකියාව තිබෙන හෙයින් ද :

එකී.................................................................................................
යන ඇය (සැකකරුගේ/සාක්ෂිකරුගේ/වෙනත් තැනැත්තාගේ *නම දන්නේ නම් සඳහන් කරන්න) ශ්‍රී ලංකාවෙහි සිටින බව විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබෙන හෙයින් ද :

ඉහත කී....................................(සැකකරුගේ/සාක්ෂිකරුගේ/වෙනත් තැනැත්තාගේ* නම දන්නේ නම් සඳහන් කරන්න) යන තැනැත්තා සිටිනා ස්ථානය සොයා ගැනීම පිණිස මෙයින් ඔබගේ සහාය ඉල්ලා සිටිනු ලැබේ.

නිශ්චිත රටෙහි නිසි බලධරයා

**ආ ආකෘති පත්‍රය**

**(7(1) වගන්තිය)**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙනට ය.

අනන්‍යතාව නොදන්නා තැනැත්තකු වන සහ ඔහු පිළිබඳව දැනගැනීමට තිබෙන තොරතුරු පහත නිශ්චිතව දැක්වෙන තැනැත්තකු .................................................යන කාරණයට (නිශ්චිත රටෙහි අපරාධ අධිකරණ බලය ඇතුළතට ගැනෙන සාපරාධී කාරණය සඳහන් කරන්න.) සම්බන්ධ බවට සැක කරනු ලබන හෙයින් ද/ඒ තැනැත්තාට ඒ කාරණය සම්බන්ධයෙන් සාක්ෂි දීමට/සහාය වීමට* හැකියාව තිබෙන හෙයින් ද :

එකී තැනැත්තා ශ්‍රී ලංකාවෙහි සිටින බව විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබෙන හෙයින් ද :

ඒ තැනැත්තා හඳුනාගැනීම සහ සිටින ස්ථානය සොයා ගැනීම පිණිස ඔබගේ සහාය මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

නිශ්චිත රටෙහි නිසි බලධරයා

**ඇ ආකෘති පත්‍රය**

**(8(1) වගන්තිය)**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙතට ය.

.................................................................................... වරද (නිශ්චිත රටෙහි අපරාධ අධිකරණයේ අධිකරණ බලය ඇතුළතට ගැනෙන සාපරාධී කාරණය සඳහන් කරන්න) සම්බන්ධයෙන් ....................................................................................
අධිකරණයෙහි (නිශ්චිත රටෙහි අධිකරණයේ නම සඳහන් කරන්න.) නඩු කටයුතු ආරම්භ කර ඇති හෙයින් ද :

.................................................................................... වෙත (විත්තිකරුගේ/සාක්ෂිකරුගේ/ වෙනත් තැනැත්තාගේ* නම සඳහන් කරන්න) භාරදීම සඳහා ඒ නඩු කටයුත්තෙහි සිතාසි/අධිකරණ නියෝග/ලේඛනයක්* නිකුත් කර තිබෙන හෙයින් ද :

ඉහත කී.................................................................................... (විත්තිකරුගේ/සාක්ෂිකරුගේ/වෙනත් තැනැත්තාගේ* නම සඳහන් කරන්න.) ශ්‍රී ලංකාවෙහි සිටින බව විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබෙන හෙයින් ද :

(මෙයට පිටපතක් යා කර තිබෙන) එම සිතාසි/අධිකරණ නියෝග/ලේඛනය* මෙහි පහත නිශ්චිතව සඳහන් කර තිබෙන ආකාරයට (භාර දිය යුතු ආකාරය නිශ්චිතව සඳහන් වන අවස්ථාවල දී) ඉහත කී................................ (විත්තිකරුගේ/සාක්ෂිකරුගේ/වෙනත් තැනැත්තාගේ නම සඳහන් කරන්න) වෙත භාරදීම පිණිස ඔබගේ සහාය මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

නිශ්චිත රටෙහි නිසි බලධරයා

**ඇ ආකෘති පත්‍රය**

**(10(1) වගන්තිය)**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙතට ය.

.................................................................................... වරද (නිශ්චිත රටෙහි අපරාධ අධිකරණයේ අධිකරණ බලය ඇතුළතට ගැනෙන සාපරාධී කාරණය සඳහන් කරන්න.) සම්බන්ධයෙන් .................................................................... අධිකරණයෙහි (නිශ්චිත රටෙහි අධිකරණයේ නම සඳහන් කරන්න.) නඩු කටයුතු ආරම්භ කර ඇති හෙයින් ද :

ඒ නඩු කටයුත්තට* අදාළව සාක්ෂි දීමේ/ඒ නඩු කටයුත්තට අදාළ ........................................ (ලේඛනයේ හෝ වෙනත් දෙයෙහි නම සඳහන් කරන්න) ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති ........................................ (සාක්ෂිකරුගේ නම සඳහන් කරන්න) නමැති අය ශ්‍රී ලංකාවේ සිටින බව විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබෙන හෙයින් ද :

ඉහත කී නඩු කටයුතුවල කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී-

(අ) ඉහත කී ..........................................................(සාක්ෂි ගැනීම අපේක්ෂිත සාක්ෂිකරුගේ නම සඳහන් කරන්න) ගේ සාක්ෂිය ගැනීම ; හෝ

(ආ) ඉහත කී ..........................................................(ඉදිරිපත් කළයුතු ලේඛනය හෝ වෙනත් දෙය විස්තර කරන්න) ඉදිරිපත් කරවා ගැනීම,

සඳහා සහ එම සාක්ෂි, ලේඛන හෝ වෙනත් දෙය මා වෙත එවීම සඳහා කටයුතු පිළියෙල කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

නිශ්චිත රටෙහි නිසි බලධරයා

**ඉ ආකෘති පත්‍රය**

**(12(1) වගන්තිය)**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙතට ය.

..........................................................එරෙහි (නිශ්චිත රටෙහි අපරාධ අධිකරණයේ අධිකරණ බලය ඇතුළතට ගැනෙන සාපරාධී කාරණය සඳහන් කරන්න) සම්බන්ධයෙන් ..............................................අධිකරණයෙහි (නිශ්චිත රටෙහි අධිකරණයේ නම සඳහන් කරන්න)* නඩු කටයුතු ආරම්භ කර ඇති හෙයින්......රටෙහි (නිශ්චිත රටෙහි නම සඳහන් කරන්න) විමර්ශන ආරම්භ කර ඇති හෙයින් ද :

දැනට ශ්‍රී ලංකාවේ .........................................................හි (ශ්‍රී ලංකාව තුළ බන්ධනාගාරගත කර තිබෙන ස්ථානය සඳහන් කරන්න) දැනට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් මත සිර දඬුවම් විඳිමින් සිටින.............................................. (සිරකරුගේ නම සඳහන් කරන්න) නමැත්තාට එම නඩු කටයුත්තට අදාළව සාක්ෂි දීමේ/එම විමර්ශනය හා සම්බන්ධව සහාය වීමේ හැකියාව* තිබෙන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින හෙයින් ද :

ඉහත කී ...................................................................... (සිරකරුගේ නම සඳහන් කරන්න) එකී නඩු කටයුතුවලට අදාළව සාක්ෂි දීමේ/එකී නඩුව හා සම්බන්ධ විමර්ශනවලට සහාය වීමේ කාර්ය* සඳහා................................................................ ට (නිශ්චිත රටෙහි නම සඳහන් කරන්න) ඉවත් කිරීම සඳහා කටයුතු පිළියෙල කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

නිශ්චිත රටෙහි නිසි බලධරයා

**ඊ ආකෘති පත්‍රය**

**(12(4) වගන්තිය)**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙත ය.

................................ වරද (නිශ්චිත රටෙහි අපරාධ අධිකරණයේ අධිකරණ බලය ඇතුළතට ගැනෙන සාපරාධී කාරණය සඳහන් කරන්න) සම්බන්ධයෙන් ................................ අධිකරණයෙහි (නිශ්චිත රටෙහි අධිකරණයේ නම සඳහන් කරන්න) නඩු කටයුතු ආරම්භ කර ඇති හෙයින්/ ................................ රටෙහි (නිශ්චිත රටෙහි නම සඳහන් කරන්න)* විමර්ශන ආරම්භ කර ඇති හෙයින් ද :

ශ්‍රී ලංකාවේ දැනට සිටින ................................ (සාක්ෂිකරුගේ නම සඳහන් කරන්න) යන අයට ඒ නඩු කටයුත්තට අදාළව සාක්ෂි දීමට/එම විමර්ශනය හා සම්බන්ධව සහාය වීමට *හැකියාව තිබෙන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින හෙයින් ද :

ඉහත කී ................................ (සාක්ෂිකරුගේ නම සඳහන් කරන්න) එකී නඩු කටයුතුවලට අදාළව සාක්ෂි දීමේ/ එකී නඩුව හා සම්බන්ධ විමර්ශනවලට සහාය වීමේ* කාර්ය සඳහා................................ ට (නිශ්චිත රටෙහි නම සඳහන් කරන්න) ඉවත් කිරීම සඳහා කටයුතු පිළියෙල කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

නිශ්චිත රටෙහි නිසි බලධරයා

**උ ආකෘති පත්‍රය**

**(15(1) වගන්තිය)**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙත ය.

................................වරද (බරපතල වරදෙහි ස්වභාවය සඳහන් කරන්න) සම්බන්ධයෙන් ................................ අධිකරණයෙහි (නිශ්චිත රටෙහි අධිකරණයේ නම සඳහන් කරන්න) නඩු කටයුතු ආරම්භ කර ඇති හෙයින්/ ................................ රටෙහි (නිශ්චිත රටෙහි නම සඳහන් කරන්න) විමර්ශන* ආරම්භ කර ඇති හෙයින් ද :

එම නඩු කටයුතුවලට/විමර්ශනයට* අදාළ ................................ (භාණ්ඩයේ හෝ දෙයෙහි විස්තරය සඳහන් කරන්න) ශ්‍රී ලංකාවෙහි තිබෙන බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින හෙයින් ද :

එම ................................ (භාණ්ඩයේ හෝ දෙයෙහි විස්තරය සඳහන් කරන්න) සඳහා සෝදිසියක් පවත්වා එය තහනමට ගැනීම පිණිස සහ එය මා වෙත එවීම පිණිස සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීම සඳහා කටයුතු පිළියෙල කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

නිශ්චිත රටෙහි නිසි බලධරයා

**ඈ ආකෘති පත්‍රය**

**(17 වන වගන්තිය)**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙත ය.

................................ යන අය (සැකකරුගේ/වරදකරුගේ* නම සඳහන් කරන්න) විසින් ................................ රටෙහි දී (නිශ්චිත රටෙහි නම සඳහන් කරන්න) ................................ වරද (බරපතළ වරදේ ස්වභාවය සඳහන් කරන්න) සිදු කර තිබෙන බවට චෝදනා කර තිබෙන/ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කර තිබෙන / වරද කළ බවට සැක කර තිබෙන හෙයින් ද :

ඒ වරද සිදු කිරීමෙන්, සෘජුවම හෝ වක්‍රව අත්කරගත් හෝ ලබාගත් ................................ යන දේපළ (දේපලෙහි විස්තරය දන්නේ නම් සඳහන් කරන්න) ශ්‍රී ලංකාවෙහි තිබෙන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති හෙයින් ද :

................................ යන දේපළ (දේපලෙහි විස්තරය දන්නේ නම් සඳහන් කරන්න) සොයා ගැනීම*/හඳුනාගැනීම/තක්සේරු කිරීම සඳහා මෙයින් ඔබගේ සහාය ඉල්ලා සිටිනු ලැබේ.

නිශ්චිත රටෙහි නිසි බලධරයා

**ඇ ආකෘති පත්‍රය**

**(19 (1) වගන්තිය)**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙත ය.

................................ යන වරද (සාපරාධී කාරණය සඳහන් කරන්න) සම්බන්ධයෙන් ................................ අධිකරණයෙහි (නිශ්චිත රටේ අධිකරණයේ නම සඳහන් කරන්න) පවරන ලද නඩු කටයුතුවල දී යම් තැනැත්තකුට ................................ යන දේපළ (දේපළ විස්තර කරන්න) අහිමි කරන/ රජය සන්තක කරන/යම් තැනැත්තකුට දඩයක් හෝ වෙනත් මූල්‍යමය දණ්ඩනයක් නියම කරන නැතහොත් වෙනත් යම් තැනැත්තකුට වන්දි ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරන/ ................................ යන දේපළ (දේපළ විස්තර කරන්න) සම්බන්ධව යම් තැනැත්තකු විසින් ගනුදෙනු කරනු ලැබීම වළක්වන ආඥාවක් කරනු ලැබ ඇති හෙයින් ද :

ඒ ආඥාවට විෂය වී ඇති ................................ යන දේපළ (දේපළ විස්තර කරන්න) ශ්‍රී ලංකාවේ තිබෙන බව/ශ්‍රී ලංකාවේ තිබෙන ඒ දේපළ ඒ ආඥාව සංතෘප්ත කිරීම සඳහා ලබාගත හැකි බව* විශ්වාස කිරීමට සාධාරණ හේතු පවත්නා හෙයින් ද :

(මෙයට පිටපතක් යා කර ඇති) ඒ ආඥාව බලාත්මක කිරීම සඳහා මෙයින් ඔබගේ සහාය ඉල්ලා සිටිනු ලැබේ.

නිශ්චිත රටෙහි නිසි බලධරයා

*අදාළ නොවන කොටස ඉවත් කරන්න.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.